කරන්දෙණිය ප්‍රාදේශීය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.1 (ඊ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	වටිනාකම රු.315,000 ක් වූ වත්කම් අයිතම 03 ක වටිනාකම පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව.	වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	වටිනාකම රු.919,900 ක් වූ උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ප්‍රාග්ධනිත නොකර ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව.	ස්ථාවර වත්කම් වර්ගීකරණයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සභාව සතු සූර්ය පැනලයේ රු.361,075 ක් පිරිවැය වූ විදුලි උපාංගවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව.	අදාළ විදුලි උපාංගවල වටිනාකම යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සභාව සතු ඉඩම් 23 ක සහ ගොඩනැගිලි 20 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරු වාර්තා ලැබුනු පසු ගිණුම්ගත කරන බව.	සභාව සතු මෙම ඉඩම් හා ගොඩනැගිලි කඩිනමින් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදලට ගෙවිය යුතු රු.මිලියන 12.76 ක ශේෂය වෙනුවෙන් ණයහිමි යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව.	ගෙවිය යුතු දෑ වෙනුවෙන් ප්‍රතිපාදන ඇතිකළ යුතුය.
(ඊ)	ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.මිලියන 1.11 ක් සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.

	ආදායමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වැඩියෙන් හා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.185,756 කින් අඩුවෙන් දක්වා තිබුණි.		
(ඇ)	2019 වර්ෂයේදී ටෙන්ඩර් ඇප තැන්පත් හා ආරක්ෂිත ඇප මුදල් පිළිවෙලින් රු. 495,500 ක් හා රු.220,600 ක් නිරවුල් කිරීම මුදල් ගිණුමේ පමණක් සටහන් වීම, සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කිරීමේදී සදොස් ලෙස ඇප ගිණුම් හර කර අතිරික්තතා හා ඌණතා ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩිවී තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(ඈ)	2022 වර්ෂයේදී කර්මාන්ත සඳහා සියයට 10 රැඳවුම් මුදල් ගිණුම රු.192,466 ක් නිරවුල් කිරීම මුදල් ගිණුමේ පමණක් සටහන් වීම සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කිරීමේදී සදොස් ලෙස අතිරික්තතා හා ඌනතා ගිණුම හර කර, කර්මාන්ත සියයට 10 රැඳවුම් බදු ගිණුම බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩු වී තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 ක ශේෂයන් සහ ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.302,925 ක වෙනසක් පැවතුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
එකතුව රු.13,116,007 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවීම නිසා ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන ශේෂ බව, අනුමැතිය ලද පසු කපා හැරීමට කටයුතු කරන බව, මෙම ශේෂවලට අදාල ලිපි ගොනු ගං වතුර තත්ත්වය හේතුවෙන් විනාශ වී ඇති බව.	තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
(අ)	**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය**	සභා බල ප්‍රදේශය තුළ පවතින දියුණු ප්‍රදේශ හඳුනාගෙන එහි පිහිටි නිශ්චල දේපළ සඳහා වරිපනම් බදු අය කරගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.	තක්සේරුව අනුව 2025 වර්ෂයේ බදු අය කිරීමට කටයුතු කරන බව.	බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන බදු පැනවිය යුතුය.
(ආ)	**ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ**			
(i)	**මු.රෙ. 571**	වර්ෂ 2 කට වැඩි රු.602,087 ක් වටිනා ශේෂ 16 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායමට ගැනීමට කටයුතු කරන බව	මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	**මු.රෙ. 177(1)**	ක්ෂේත්‍රයේ දී එක්රැස් කරනු ලබන මුදල් එදිනම හෝ ඊට පසු දිනම ප්‍රේෂණය කළ යුතු වුවත්, සභාවේ ආදායම් පරීක්ෂක විසින් එකතු කරන	ක්ෂේත්‍රයේදී රැස් කරන මුදල් එදිනම හෝ ඊට පසු දිනම උපලේඛනයත්	මෙවැනි ප්‍රමාදයන් නොවන පරිදි කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කිරීමට හා

		ලද රු.200,450 ක මුදලක් දින 47 ක කාල පමාවකින් පසුව කාර්යාලයට ලබා දී තිබුණි.	සමහම විෂයභාර නිලධාරී වෙත ඉදිරිපත් කර මුදල් බැඳීම සිදු කරන බව.	ඒ අනුව ක්‍රියා නොකරන නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කළ යුතුය.
(ඇ)	**2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**	උපරිම කාලසීමාව වන අවුරුදු 05 ක් එක් සේවා ස්ථානයක සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වාර්ෂික ස්ථාන මාරු ලබා දිය යුතු වුවද, එයට අනුකූළ නොවන පරිදි ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් 05 දෙනෙකු වසර 06 ත් 08 ත් අතර කාලයක් එකම සේවා ස්ථානයේ සේවයේ යොදවා තිබුණි.	ලැබෙන ස්ථාන මාරු නියෝග අනුව කටයුතු කරන බව.	ස්ථාන මාරු ප්‍රතිපත්ති අනුව හා චක්‍රලේඛයේ නියමයන්ට අනුව අදාළ නිලධාරීන් උචිත පරිදි ස්ථාන මාරු කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,497,532 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,020,062 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල්කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල්කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.
වරිපනම් හා බදු	4,060,657	5,118,155	5,876,081	4,863,067	4,168,798	4,741,920	5,108,424	5,620,998
කුලී	7,473,420	9,752,835	7,115,338	6,943,901	8,910,350	6,659,850	9,887,267	4,306,404
බලපත්‍ර ගාස්තු	531,200	1,519,635	1,540,635	128,350	450,100	422,597	398,597	149,350
වෙනත් ආදායම්	5,725,000	12,873,134	12,129,506	791,820	11,883,000	8,463,326	8,460,326	48,192
	17,790,277	29,263,759	26,661,560	12,727,138	25,412,248	20,287,693	23,854,614	10,124,944

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
	වරිපනම් හා බදු		
(i)	සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ වරිපනම් හා බදු ආදායම රු.මිලියන 5.62 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් ඇතුළත්ව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.මිලියන 10.74 ක් වුවද, රැස් කළ ආදායම රු.මිලියන 5.88 ක් වීමෙන් රු.මිලියන 4.86 ක හිඟයක් පැවතුණි.	ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් රැස් කිරීමට අදාළ නිශ්චිත කාල රාමුවක් සහිත වැඩපිළිවෙලක් සකස් කර ඒ අනුව හිඟ ආදායම් රැස් කර ගත යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂය තුළදී වරිපනම් ඒකක 105 කින් කිසිදු බදු මුදලක් අය කරගෙන නොතිබුණි.	ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	1946 අංක 30 දරණ බදු හා තක්සේරු කරන ආඥා පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපළ වසර 05 කට වරක් තක්සේරුව සිදු කළ යුතු වුවද 2008 වර්ෂයේ සිදු කළ වසර 16 කට වඩා පැරණි තක්සේරු වටිනාකමක් මත පදනම්ව බදු අය කිරීමෙන් සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි.	2025 වර්ෂයේ සිට බදු අය කිරිමට කටයුතු කර ඇති බව	වර්තමාන වටිනාකමට දේපළ පනත ප්‍රකාරව තක්සේරු කර ආදායම් රැස්කළ යුතුය.
(ආ)	**කුලී**		
(i)	සමාලෝචිත වර්ෂය ආරම්භයට අය විය යුතු බදු කුලී ආදායම රු.මිලියන 4.31 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් වූ රු.මිලියන 9.75 ක් ඇතුළත්ව වර්ෂයේ දී අයවිය යුතු මුළු ආදායම රු.මිලියන 14.1 ක් වුවද, රැස් කළ ආදායම රු.මිලියන 7.12 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.මිලියන 6.94 ක් දක්වා වැඩි වී තිබුණි.	හිඟ ශේෂ අය කර ගැනීමට හා දිගින් දිගටම පවතින නොගෙවන ශේෂ සඳහා නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කරන බව.	හිඟ ආදායම් රැස් කිරීමට අදාළ නිශ්චිත කාල රාමුවක් සහිත වැඩපිළිවෙලක් සකස් කර ඒ අනුව හිඟ ආදායම් රැස්කර ගත යුතුය.
(ii)	ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 241 න් 83 කට අදාළව රු.මිලියන 3.46 ක මුදලක් හිඟව පැවතියද එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව.	අදාළ හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

(iii)	දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 දරණ චක්‍රලේඛයේ 16 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන්ම එක්වන් මුදල් ගෙවා අවසන්ව ගිවිසුම්වලට එළඹිය යුතු වුවත්, සභාවට අයත් කඩ කාමර 03 ක් සඳහා එසේ ගිවිසුම්ගත වී නොතිබුණි. කඩ කාමරවලට අදාළ සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවද, කඩ කාමර 72 ක ගිවිසුම් යාවත්කාලින කර නොතිබුණි.	ගිවිසුම් යාවත්කාලින කිරීමට කටයුතු කර ඇති බව.	චක්‍රලේඛ උපදෙස් අනුව ගිවිසුම්වලට එළඹී සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතුය.
(iv)	වසර 05 කට වරක් නව තක්සේරුවක් මඟින් කඩ කාමර කුලිය සංශෝධනය කළ යුතු වුවද , සභාව සතු කඩ කාමර 94 ක් 2015 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව කුලී අය කිරිම නිසා සභාවට ලැබිය යුතු කුලී ආදායම් අහිමි වී තිබුණි.	තක්සේරු ප්‍රතිශෝධනයක් සිදු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව.	කඩ කාමරවල වර්තමාන වටිනාකම තක්සේරු කර කඩිනමින් ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**බලපත්‍ර ගාස්තු**		
	සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.128,350 ක බලපත්‍ර ගාස්තු හිඟයක් පැවතුණි.	ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් රැස් කිරීමට අදාළ නිශ්චිත කාල රාමුවක් සහිත වැඩ පිළිවෙලක් සකස් කර ඒ අනුව හිඟ ආදායම් රැස් කර ගත යුතුය.
(ඇ)	**වෙනත් ආදායම්**		
(i)	සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.48,192 ක් වූ වෙනත් ආදායම් හිඟය සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.791,820 ක් දක්වා වර්ධනය වී තිබුණි.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් රැස් කිරීමට අදාළ නිශ්චිත කාල රාමුවක් සහිත වැඩ පිළිවෙලක් සකස් කර ඒ අනුව හිඟ ආදායම් රැස් කර ගත යුතුය.
(ii)	2023 නොවැම්බර් 10 දිනැති අංක 2358 දරණ ගැසට් නිවේදනය අනුව ටී.ඩී.සමරවීර ක්‍රීඩාංගනය බදු දීම වෙනුවෙන් ආදි ශිෂ්‍ය සංගමයකින් ලැබිය යුතු විනෝද බදු හා ක්‍රීඩාංගණ ගාස්තු වූ රු.111,000 ක් අයකරගෙන නොතිබුණි.	ගරු ආණ්ඩුකාර තුමාගේ නියෝග මත මුදල් නිදහස් කිරීමට කටයුතු කර ඇති බව.	අදාළ ගැසට් නිවේදනය ප්‍රකාරව විනෝද බදු හා ක්‍රීඩාංගණ ගාස්තු නියමිත පරිදි අය කිරීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
දිස්ත්‍රික් අනුමත මිල කමිටු මිල ගණන් අනුව හියුම් පයිප්ප සී/ස බද්දේගම (බටහිර) ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතියේ මිල ගණන්වලට අනුකූලව මිලදී ගත යුතු වුවද එයට අනුකූල නොවන පරිදි ප්‍රමිතිය පිළිබඳ සැලකිලිමත් වීමකින් තොරව අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ වෙනත් ආයතනයකින් රු.448,000ක් වටිනා හියුම් පයිප්ප 22 ක් මිලදී ගෙන තිබුණු අතර සභාව විසින් හියුම් පයිප්ප 9 ක් සඳහා රු.86,200ක් වැඩිපුර ගෙවා තිබුණි.	ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතියේ මිල ගණන්වලට සිදු කරන බව.	දිස්ත්‍රික් අනුමත මිල කමිටු මිල ගණන් අනුව මිලට ගතයුතු අතර වැඩිපුර ගෙවා ඇති මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
සමාලෝචිත වර්ෂයේදී ගබඩාවෙන් නිකුත් කර තිබුණු විදුලි භාණ්ඩ ප්‍රමාණය සහ වීදි පහන් අංශය මඟින් සවි කරන ලද ප්‍රමාණය අතර පිරිවැය රු.219,959 ක් වූ අයිතම 12 කට අයත් ඒකක 563 ක වෙනසක් පැවතුණි.	තොග ලේඛන සැසඳීමක් කිරීමෙන් මෙම වෙනස නිවැරදි කරන බව.	සැසඳීමක් සිදුකර වෙනසට හේතු අනාවරණය කරගත යුතු අතර මේ පිළිබඳ අභ්‍යන්තර පාලනය විධිමත් කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර 54 ක් සභාව විසින් අනුමත කර තිබුණද , ඉන් ආයතන 8 ක් පමණක් අනුකූලතා සහතික ලබාගෙන තිබුණි. 1978 අංක 45 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 10(6) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි සංවර්ධන බලපත්‍රයක් වසර 02 ක් දක්වා පමණක් දීර්ඝ කළ හැකි වුවද සභාව විසින් එම බලපත්‍ර ලබා දීමෙන් පසු ගොඩනැගිලි 54 ක අධීක්ෂණයක් සිදු කළ බවට තොරතුරු නොවීය.	සභාවේ සැලසුම් කමිටු අනුමැතිය ලබාගෙන ඇති බව හා අනවසර ඉදිකිරීම් නොවන බව.	අනුකූලතා සහතික ලබා නොගත් ඉදිකිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරී පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසන් දිනට සභාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී, පුස්තකාලාධිපති, ආදායම් පරීක්ෂක, ආයුර්වේද ඖෂධ සංයෝජක ඇතුළු තනතුරු කිහිපයක පුරප්පාඩු 19 ක් පැවති අතර නිලධාරීන් 4 දෙනෙකුගේ අතිරික්තතා පැවතුණි.	කාර්ය මණ්ඩල පුරප්පාඩු පිළිබඳ පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව.	සභාවේ කාර්යභාරය හා විෂය පථය අනුව කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු සේවක ණය ශේෂය රු.මිලියන 1.57 ක් වූ අතර ඉන් එකතුව රු.396,981ක් වූ ශේෂයක් වසර 3 ත් වසර 36 ත් අතර කාලයක සිට පැවත එන ණය ශේෂයන් විය.	අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ශේෂ කඩිනමින් අය කරගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 1961.6 ක් වූ වැඩ යෝජනා 40 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉතිරි සංවර්ධන ව්‍යාපෘති ඉදිරියේදී ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන බව.	සභාව සතුව පවතින සම්පත් හා අරමුදල් සැපයීම සැලකිල්ලට ගෙන විද්‍යාත්මකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක තත්වයට පත්කළ යුතුය.